දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 19/2014(11)

මගේ අංකය :ඩී/බ.කො.ජ/2014
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2014.06.13

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>බන්ධනාගාර නිලධාරීන් සඳහා දීමනා ලබාදීම.</u>

උක්ත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2014.05.29 හා 2014.06.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 19/2014 හා 19/2014 (1) චක්‍රලේඛවලට අමතරවයි.

01. 19/2014(1) හි 05 ඡේදය
    යහපත් කල් ක්‍රියා දීමනාව 2014.04.01 දිනෙන් පසුව ලබාදෙන දඬුවම් පමණක් සලකා කාලය පදනම් කරගත යුතුය.
02. එහි අංක 03 සිරමැදිරි රාත්‍රී රාජකාරි දීමනාව ලෙස සංශෝධනය විය යුතුය.
03. ඉහත චක්‍රලේඛයේ අවසන් ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතුය.

" ඉහත අංක 02 සිට 08 දක්වා දීමනා ලබාගැනීමට මසකට අවම වශයෙන් දින 21 ක් සේවය කළ යුතු අතර වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන ඇති අය සඳහා දීමනාව හිමි නොවන අතර දින 21 ට අඩු දින ගණනක් සේවය කර ඇති නිලධාරීන් සඳහා අනුපාතිකව ගණන් බලා දීමනා ගෙවිය යුතුය."

<u>පැහැදිලි කිරීම</u>

- සහකාර බන්ධනාගාර අධිකාරි තනතුරේ වැඩ ආවරණය කිරීමට පත් කර ඇති නිලධාරීන්ට හිමිවිය යුත්තේ වැඩ බලන හෝ වැඩ ආවරණ නිලධාරි තනතුරට අදාළ දීමනා පමණි.
- අංක 08 හි සඳහන් ගමන් වියදම් දීමනාව සංයුක්ත දීමනාව ගෙවනු නොලබන උසාවි ආරක්ෂණය හා රෝහල් වල සිරකරුවන් රැගෙන යනු ලබන නිලධාරීන්ට ගෙවන බැවින් කාලය සහ වැටුප අනුව ගෙවිය යුතුය.
- අභ්‍යන්තරයේ පිහිටි බන්ධනාගාර රෝහල් වලට කරනු ලබන ආරක්ෂණ හා එකම පරිශ්‍රයේ බන්ධනාගාර ආයතන සඳහා කරනු ලබන ආරක්ෂණය සඳහා අංක 08 හි දීමනා ගෙවිය නොහැකිය.
- හෙද නිලධාරීන් සඳහා සෞඛ්‍ය ආරක්ෂක දීමනාව හිමි නොවන අතර අවදානම් දීමනාව හිමි වේ.
- අංක 06 සහ 07 හි දීමනා සෘජුවම බන්ධනාගාර රාජකාරි කරනු ලබන ඖෂධ සංයෝජක, ගබඩා භාර නිලධාරීන්ට හිමි වේ.
- ජේලර් යන තනතුරට 11 පෙල ජේලර්,1 පෙළ ජේලර් සහ ප්‍රධාන ජේලර් තනතුරු අයත්ය.
- සෘජුවම බන්ධනාගාරයේ රාජකාරි කරනු ලබන උපාධිධාරී සේවය යටතේ පත් කරන ලද උපාධිධාරින් වන සංවර්ධන නිලධාරීන් (සැලසුම් සහකාර) හට අංක 06 හා 07 හි දීමනා හිමි වේ.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්